# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2162/61 - 2020 පෙබරවාරි මස 14 වැනි සිකුරාදා - 2020.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7(1) වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4-3/8/2017/PC/320.

*මගේ යොමු අංකය*: WAR/LAN/ACQUS/A2/5-86.

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 88ඒ, පොල්ගම්පල ග්‍රාම නිලධාරී වසමේ මාකුර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට කෑගල්ල දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් 2020.01.14 දිනැතිව පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක කෑ 3755 හි පහත විස්තර කරන ඉඩම් කොටස:

**කැබලි අංක 01**

ඉඩමේ නම: මිල්ලගහමුලහේන; ඉඩමේ විස්තරය: වත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම්පාන්නා: විජේසිංහලාගේ සරත් විජයසිංහ, අංක 49/43, වේයන්ගොඩ පාර, කළගෙඩිහේන; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.3347.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2020.04.09 වැනි දින පෙ.ව. 10.00 ට වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2020.03.25 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඒ. එම්. රංගන සජීව,
ප්‍රාදේශීය ලේකම්,
වරකාපොල.

2020 පෙබරවාරි මස 11 වැනි දින,
වරකාපොල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

02 - 623

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 2/2/1/78.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ*
*යොමු අංකය*: 13/99/PC/06.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුව සුළු කොට්ඨාසයේ, නැදුන්ගමුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් 2006.08.14 වැනි දිනැතිව පිළියෙල කරන ලද මූලික සිතියම් අංක 3548 හි පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0355 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (03):

01. **කැබලි අංක 1**
ඉඩමේ නම: ඕතුදෙනමිල්ලගහකුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: ගෝවින්නගේ පත්මාවතී, 68, උඅරුවෙල, නැදුන්ගමුව (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0075.

02. **කැබලි අංක 2**
ඉඩමේ නම: ඕතුදෙනමිල්ලගහකුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සේනාධීර සෝමරත්න සේනාධීර, 2/51, උඅරුවෙල, නැදුන්ගමුව (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0115.

03. **කැබලි අංක 3**
ඉඩමේ නම: ඕතුදෙනමිල්ලගහකුඹුර; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: හලාවතගේ ස්ටීවන් පෙරේරා, 562, උඅරුවෙල, නැදුන්ගමුව (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0165.

***පරීක්ෂණ දින:***

| *කැබලි අංක* | *දිනය* |
|---|---|
| 01-03 දක්වා | 2020.04.27 |

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තමතමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ ඉහත සඳහන් දිනයන්හි දී පෙරවරු 09.30 ට ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2020 අප්‍රේල් මස 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

කේ. ඒ. එස්. එල්. ගුණතිලක,
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරී,
ගම්පහ.

2020 අප්‍රේල් මස 03 වැනි දින,
ගම්පහ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

02 - 624